## කුරුණෑගල ප්‍රාදේශීය සභාව
## කුරුණෑගල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020මාර්තු 30දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජූනි 30 දින දවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මිංහෙට්ටිය පුස්තකාල ගොඩනැගිල්ලේ හා දෙමළුස්ස ප්‍රජා ශාලාවේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරුකර ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී තක්සේරුකර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | රු.7,175,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ වරද ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සුභ සාධන සහ පොදු පහසුකම් සඳහා දරන ලද ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර රු.5,362,181 ක් වුවද එය ආදායම් වියදම් ගිණුමේ රු.5,313,556 ක් ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් එම වියදම රු.48,625 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිණුම් විෂයයන් 04 කට අදාළවමූලා ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.45,281,335 ක නොසැසදීම් පැවතුණි. | අදාළ වෙනස්කම් සසඳා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛන ඉදිරිපත් නොකළ ශේෂය ඉදිරි වර්ෂයේදී තහවුරු කරගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | වටිනාකම රු.1,499,420 ක් වූ ගිණුම් විෂයයන් 04 ට අදාළව අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි/ උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | **අත්තිකාරම්**<br>වර්ෂ ගණනාවක සිට පැවත එන අගයකි. තහවුරු කර ගැනීමෙන් පසු ඉවත් කිරීමට කටයුතු කරමි.<br><br>**වෙනත් ආයතනවල කළ තැන්පත්**<br>සභාව සතුව කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැත.<br><br>**සේවක ඇප තැන්පතු**<br>සේවක ඇප තැන්පත් ලේඛනය ඉදිරිපත් කරන ලදී.<br><br>**ආයෝජන - වෙනත්**<br>සභාව සතුව කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැත. |

## 1.4 අනුකූල නොවීම්

--------------------

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූලා හා පාරිපාලන) රීති | | | |
| i. | 19 රීතිය | සභාව විසින් එක් අවස්ථාවකදී උප පත්‍රිකා පොත් කිහිපයක් එක් පුද්ගලයකුට නිකුත් කර තිබුණි. | උප පත්‍රිකා පොත් නිකුත් කිරීමේදී අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වාදුන් කරුණු අප විසින් පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 212 රීතිය | භාණ්ඩ ගබඩාවට ලැබීමට පෙර මුදල් ගෙවා තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන විධිවිධාන අනුව අදාළ මිලදීගැනීම සිදුවී නැති බවත් නැවත එවැනි වැරදි සිදුනොවන බවත් කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහය<br>---------------------------- | | | |
| i. | ii වැනි පරිච්ඡේදයේ 11.1හා11.5 වගන්ති | වසර 03 ක කාලසීමාව ඉක්මවා ඇති නිලධාරීන් 05 ක් සඳහා 2020 ජනවාරි 17 දින වන විටත් ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු සිදුකර නොතිබුණි. | සේවය ස්ථිර කිරීමට අදාළ සුදුසුකම් සපුරා ඇත්නම් අදාළ කටයුතු සිදුකළ යුතුවේ. | සේවය ස්ථිර කිරීමට අදාළ කටයුතු සිදුවෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |
| ii. | VIII වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය හා 10.1 වගන්තිය | නිවාඩු දින වැටුප් ගෙවීමේදී පැය 08 ක කාලය සම්පූර්ණ නොකළ කාලසීමාවක් සඳහා ගෙවීම් කර තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ | පිළිතුරු දක්වා නොමැත. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.172,537,834 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.169,539,235 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංග්‍රහ වියදම්වලට අදාළ දෛනික බිල්පත් සියල්ල සභාවේ කාර්යාල කාර්ය සහායකයෙකු දෛනිකව එකතු කර තබාගෙන මාසිකව සරප් වෙත බිල්පත් ඉදිරිපත් කර 2019 වර්ෂයේදී ඔහුගේ නමට රු. 559,723 ක් වටිනා චෙක්පත් ලබාගෙන තිබුණි. | අදාළ පාර්ශවයන්ට ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා අතර, ඉදිරියේදි සභාවේ සංග්‍රහ වියදම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව වැයකිරීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 11,472,513 | 12,337,759 | 13,925,634 | 7,735,198 | 11,531,440 | 13,769,491 | 12,123,518 | 8,070,706 |
| II. | බදු කුලී | 2,851,470 | 2,601,139 | 2,594,780 | 15,168 | 2,894,440 | 2,505,013 | 2,248,297 | 14,909 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,645,300 | 2,086,005 | 2,086,005 | - | 1,839,800 | 1,778,204 | 1,778,204 | - |
| IV. | වෙනත් ආදායම් | 220,354,657 | 278,295,690 | 213,362,838 | 105,253,983 | 164,753,680 | 258,258,244 | 341,266,731 | 41,196,061 |
| එකතුව | | 236,323,940 | 295,320,593 | 231,969,257 | 113,004,349 | 181,019,360 | 276,310,146 | 357,416,750 | 49,281,676 |

**2.3.2 වරිපනම් හා බදු**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුඩාගල්ගමුව කාර්යාලයේ හාවැල්ලව උපකාර්යාලවල වරිපනම් බදු හිඟය පිළිවෙලින් රු.855,648 ක් හා රු.3,365,659 ක් විය. | ප්‍රාදේශීය සභා පනත හා රීති ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට වැල්ලව උපකාර්යාලයේ දේපල 225 කින් රු.230,043 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | ප්‍රාදේශීය සභා පනත හා රීති ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී අක්කර බදු සමීක්ෂණයක් මේ වන විට සිදුකරමින් පවතින අතර එම වාර්තා ලබාගෙන ලේඛන යාවත්කාලීන කර හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යය සාධනය**

--------------------

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සම්බන්ධයෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සභාවේ අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඇතිවන සේවා අවශ්‍යතා මත ඉතිරි කාරණා යටතේ අතුරු ව්‍යවස්ථා පැනවීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල්පිටිය හා වැල්ලව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා අයවැය තුළ රු.40,000,000 ක් වෙන්කර තිබුණ ද එම කටයුතු 2019 වර්ෂයේ දී ඉටුකර නොතිබුණි. | ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද මුදල් අදාළ කාර්යයන් සඳහා යෙදවිය යුතුවේ. | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සකස් සකස් කිරීම, මූලික සැලසුම් සකස් කිරීම් කටයුතු මේවන විට නිමකර ඇති බව විගණනයට ඉතා කාරුණිකව දන්වා සිටිමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.2,396,728 ක් වැයකර 2016 වර්ෂයේ ඉදිකර තිබූ දම්බොක්ක නොදිරන කසල වර්ගීකරණ මධ්‍යස්ථානය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිශ්කාර්යව පවතින සභා දේපළ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නොදිරන කසල ගෙනවිත් දමා තෝරා ගැනීම සඳහා අංගනයක් ද, විදුලිය, ජලය වැනි මූලික පහසුකම් ද සපුරාගෙන එම ගොඩනැගිල්ල නොදිරන කසල ගබඩා කරන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී හඳුනාගන්නා ලද සංවර්ධන අරමුණු 09 ක් තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හඳුනාගෙන ඒ අනුව අයවැය ලේඛන පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ක්‍රියාත්මක කරනු ලබන උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය හා සම්බන්ධ වෙමින් තිරසර සංවර්ධන අරමුණු තවදුරටත් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වූ වසරක් ඉක්මවා තිබූ රු. 48,122,553 ක් හා වර්ෂ 05 ක් ඉක්මවා තිබූ රු.31,331,765 ක් විය. | තවදුරටත් අයවිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණයගැති ශේෂය තහවුරු කර ගැනීමෙන් පසු අයකර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව පෙන්වා දෙමි . |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන උපලේඛන නොමැති රු. 22,930,189 ක් විය. | ගෙවිය යුතු ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම අගය උපලේඛන රහිත අගයක් බැවින් අනාවරණය කර ගැනීමෙන් පසුව ඉදිරියේදී ගැළපීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අනුමත කාර්ය මණ්ඩලය තුළ නිලධාරීන් 16 කගේ ඌණතාවයක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බඳවාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ බඳවාගත් සේවකයින් 04 දෙනෙකු අදාළ රාජකාරිවල නොයොදවා කාර්යාල රාජකාරිවල යොදවා තිබුණි. | තනතුරට අදාළ රාජකාරිවල යෙදවිය යුතුවේ. | 25/2014 යටතේ බඳවාගන්නා ලද කාන්තා සේවිකාවන් තිදෙනෙකු ඔවුන් දක්වන සුවිශේෂී හැකියාව මත සේවය සඳහා රඳවා තබා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.එහි එක් නිලධාරිනියක් පුස්තකාල සහායක ලෙස පත්වීම් ලබා ඇත. |

**3.4** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් දේපල තක්සේරුව වසර 05 ට වරක් සිදුකළ යුතු වුවද, අවසාන වරට දේපල තක්සේරුව 2011 වර්ෂයේදී සිදුකර තිබුණි. | නියමිත කාලය තුළ දේපල තක්සේරු ලබාගෙන බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරු වාර්තාව ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළද මෙතෙක් තකසේරු වාර්තාව නොලැබුණු බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.5** **වත්කම් කළමනාකරණය**

**පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ දී දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ ඉදිකළ රු.84,469,200 ක් වටිනා සායන මධ්‍යස්ථාන 05 ක්පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අපවෙත අදාළ ඉඩම් පවරා දී නොමැති නමුත් මේ වන විට පවරාදීමේ කටයුතු සිදු කරමින් පවතී. |

**3.6** **ප්‍රසම්පාදනය**

**සැපයීම් හා සේවා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.100,740 ක් වටිනා ෆයිබර් ඉනිමඟ 02 ක්, රු.97,500 ක්වටිනා මග් 300 ක්, රු.634,930 ක් වටිනා පෙර පාසල් දරුවන් සඳහා කුඩ 2,097ක් හා රු.169,000 ක් වටිනා සාරි 130 ක් මිලදී ගැනීමේ දීප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ6.3.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මිලදී ගැනීම් සිදු කිරීමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | අතපසුවීමකින් වැරදි දිනයක් යොදා ලිපිය සකස්කරඇත. අදාළආයතනවලට යවන ලිපිවල ලිපිනය සඳහන් කළද කාර්යාල පිටපතෙහි ලිවීමට අතපසුවී ඇත. මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවන බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 (අ) ප්‍රකාරව ලංසුකරු ලංසුවට අත්සන් තබා නොමැතිනම් ලංසුව ප්‍රතික්ෂේප කළයුතු වුවත් ඉවුම් පිහුම් කට්ටල, ප්ලාස්ටික් පුටු හා VIP හට් මිලදී ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මිලදී ගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකළ යුතුවේ. | ලංසු පත් වල අත්සන් සහ රබර් මුද්‍රව ඇගයීමේදී විශේෂයෙන් සලකා බලනු ලබනනමුත් අතපසුවීමකින් අදාළ මිලගණන් පිළිගෙනඇත.ඉදිරියේදී එසේනොවීමටකටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |